පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය
மாகாண பொதுச்சேவை ஆணைக்குழு, கிழக்கு மாகாணம், திருகோணமலை
PROVINCIAL PUBLIC SERVICE COMMISSION, EASTERN PROVINCE, TRINCOMALEE


ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No: EP/07/03/02/42-10/2016

2017.08.31

ප්‍රධාන ලේකම්/ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/
පළාත් අධ්‍යක්ෂවරුන්/කොමසාරිස්වරුන්/මහ නගර සභා කොමසාරිස්වරුන්/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/නගර සභා ලේකම්වරුන්/
ප්‍රාදේශීය සභා ලේකම්වරුන්,
නැගෙනහිර පළාත.

**රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් (සිවිල්/යාන්ත්‍රික) සඳහා පවත්වනු ලබන ලිඛිත විභාගය - 2010 සිට 2016 දක්වා**

විභාග කොමසාරිස් ජනරාල් විසින් යොමු කරන ලද අංකඃ 5/3/3/GTO/2010-2016/T හා 2017.08.09 දිනැති ලිපියෙහි සඳහන් පරිදි ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ කාර්යාලය යටතේ සේවය කරන ඉහත සඳහන් නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර, ආදර්ශ අයදුම්පතට සමාන අයදුම්පතක් සකසා නිවැරදිව සම්පූර්ණ කර ඔබගේ නිර්දේශය සහිතව **2017.09.13** වන දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් අදාල අය දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සටහන ඃ **විභාග කොමසාරිස් ජනරාල් විසින් යොමු කරන ලද ලිපිය සහ ආදර්ශ අයදුම්පත www.ep.gov.lk -----> Recruitments and Exams යන නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට හැකිය.**

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්.

පිටපත ඃ- ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්. - අ.ක.ස.


**தொலை பேசி / දුරකතන / Telephone**

அலுவலகம் / කාර්යාලය / Office : 026 2220092
தொலைநகரி / ෆැක්ස් / Fax : 026 2222174
மின்அஞ்சல் / විද්‍යුත් තැපැල / E-mail : ppsc@ep.gov.lk

198, உட்துறைமுக வீதி, திருகோணமலை
198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය
198, Inner Harbour Road, Trincomalee

මගේ අංකය : 5/3/3/GTO/2010-2016/T
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2017.08.09 දින.

සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල ප්‍රධානීන්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
හා අනෙකුත් ආයතන ප්‍රධානීන් වෙත,

**රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් (සිවිල්/යාන්ත්‍රික) සඳහා**
**පවත්වනු ලබන ලිඛිත විභාග - 2010 සිට 2016 දක්වා**

පූර්වෝක්ත විභාග 2017 දෙසැම්බර් මස පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන යොදනු ලැබේ. 2010 සිට 2016 දක්වා වූ වර්ෂයන්ට අදාළව පැවැත්විය යුතු විභාග සියල්ලම ආවරණය වන පරිදි උක්ත විභාග පැවැත්වෙනු ඇත.

ඒ සඳහා අයදුම්පත් හා ඇතුළත්වීමේ ලැයිස්තු 2017 අගෝස්තු මස 25 වන දින සිට සැප්තැම්බර් මස 15 වන දින දක්වා භාරගනු ලැබේ.

02. මෙම විභාග නිවේදනයේ අඩංගු කරුණු ඔබගේ ආයතනයේ අදාල ශ්‍රේණිවල සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

03. I. <u>විභාග</u> : මෙම විභාග 1 වැනි, 2 වැනි සහ 3 වැනි විභාගය යනුවෙන් කොටස් 03 කට බෙදෙන අතර, පහත දැක්වෙන ශ්‍රේණිවල උසස් කිරීම සඳහා සුදුස්සන් තේරීම, එම විභාගවල ප්‍රතිඵල මත සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1 වැනි විභාගය | : | (සිවිල්) | - උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම |
| 1 වැනි විභාගය | : | (යාන්ත්‍රික) | - සහකාර ෆෝමන් ශ්‍රේණියට උසස් කිරීම |
| 2 වැනි විභාගය | : | (සිවිල්) | - පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම |
| 2 වැනි විභාගය | : | (යාන්ත්‍රික) | - ෆෝමන් II වැනි ශ්‍රේණියට උසස් කිරීම |
| 3 වැනි විභාගය | : | (සිවිල්) | - සහකාර ඉංජිනේරු ශ්‍රේණියට උසස් කිරීම |
| 3 වැනි විභාගය | : | (යාන්ත්‍රික) | - ෆෝමන් I වැනි ශ්‍රේණියට උසස් කිරීම |

II. <u>**විභාගයේදී අයදුම්කරුවකුට පෙනී සිටිය හැක්කේ එක් ශ්‍රේණියකට අයත් විභාගයකට පමණි.**</u>

04. <u>**විභාග මධ්‍යස්ථානය :**</u> ලිඛිත විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

05. <u>**සුදුසුකම් :**</u> මෙම විභාග සඳහා ඉදිරිපත් වන සෑම විභාග අපේක්ෂකයෙක්ම,

(අ) ස්ථිර සේවයේ නියුක්ත රජයේ/ සංස්ථා/ මණ්ඩල/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයකු විය යුතුය.

(ආ) ඉහත 03 හි දක්වා ඇති කවර හෝ ශ්‍රේණියකට උසස්වීමක් ලැබීම සඳහා හෝ කාර්යක්ෂමතා කඩඉමකින් උසස් කිරීමට හෝ මෙම විභාගයෙන් සාමාර්ථයක් ලැබිය යුතු බවට, නිලධාරියා දැනට සේවය කරන තනතුරට අදාළ බඳවා ගැනීමේ හෝ උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති අයෙකු විය යුතුය.

(ඇ) මෙම විභාග සඳහා ඉදිරිපත් කරන අයදුම්කරුවන්, ඉහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට, අදාළ ආයතන ප්‍රධානියා සෑහීමකට පත් විය යුතුය.

06. <u>**අයදුම්පත් :**</u> විභාග සඳහා ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන විභාග අපේක්ෂකයින් මෙම විභාග නිවේදනයෙහි අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව, තම තමන්ගේ අයදුම්පත්‍ර 8" x 11" ප්‍රමාණයේ කඩදාසියෙහි දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ශීර්ෂ අංක 01 සිට 04 දක්වා ශීර්ෂ මුල් පිටුවටද අනෙකුත් ශීර්ෂ අනෙක් පිටු වලටද ඇතුළත්වන පරිදි තම අත්අකුරින්ම සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් වන විෂයයන් ලකුණු කිරීම සඳහා, මේ සමග සපයා ඇති විෂය ලැයිස්තුව උපයෝගී කර ගත යුතුය. අයදුම් පත්‍ර ඇතුළත්වීමේ ලැයිස්තුවල උප ලේඛණගත කර මා වෙත ඉදිරිපත් කිරීම, එම විභාග අපේක්ෂකයන් අයත් වන ආයතනයන්හි ප්‍රධානීන් මගින් සිදුවිය යුතු බැවින්, නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අයදුම්කරුවන් කල්වේලා ඇතිව තම අයදුම් පත් ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය. මෙම විභාග ඉල්ලුම් කිරීම සඳහා ඇතුළත්වීමේ ලැයිස්තු ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යොදන්න.

6.1 ඉහත සඳහන් පරිදි මෙම විභාග ශ්‍රේණි 03 කට අයත් විභාග 03 කින් යුක්ත බැවින්, ආයතන ප්‍රධානීන් තමන් වෙත ලැබෙන අයදුම්පත් එක් එක් විභාග අනුව වර්ග කර, ඇතුළුවීමේ ලැයිස්තුවල උප ලේඛණ ගත කොට ආවරණ ලිපියක් සමඟ මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

6.2 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඇතුලත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් හා ඇතුළත්වීමේ ලැයිස්තු **2017 සැප්තැම්බර් මස 15 වන දින හෝ ඊට පෙර** මා වෙත ලැබෙන සේ, **"විභාග කොමසාරිස් ජනරාල්", සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඇතුළත්වීමේ ලැයිස්තු හා අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කිරීම වැදගත්ය.

6.3 අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

6.4 කිසිදු ලියවිල්ලක් හෝ සහතිකයක් අයදුම්පත්‍රයට ඇමිණිය යුතු නොවේ.

6.5 **අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම :** පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන් කිසි අන්දමින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම්පත්.

(ආ) නියමිත විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අමුණා නොමැතිව ඉදිරිපත් කර ඇති අයදුම්පත්.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්.

6.6 ඉහත දෝෂ මගහරවා ගැනීම සඳහා අයදුම්පත්‍ර එවීමට ප්‍රථම එය විභාග නිවේදනයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කර අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද හා නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර ඇතුළත් කර ලදුපත නියමිත පරිදි අලවා ඇත්දැයි විමසා බලන්න. අයදුම්පත්‍රයේ හා ලදුපතෙහි ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

6.7 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07. **විභාග ගාස්තු :** මෙම විභාගය සඳහා පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඉන්පසු ඉදිරිපත් වන සෑම අවස්ථාවකදීම පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

**ලිඛිත විභාග සඳහා :**

| | | |
|---|---|---|
| විෂයයන් එකකට | - | රු. 300/- |
| විෂයයන් දෙකකට | - | රු. 400/- |
| විෂයයන් තුනකට | - | රු. 500/- |
| විෂයයන් හතරකට හෝ ඊට වැඩි | - | රු. 600/- |
| **ප්‍රායෝගික කොටස සඳහා ගාස්තු** | **-** | **රු. 1200/-** |

ප්‍රායෝගික කොටස සඳහා ගාස්තු ගෙවිය යුත්තේ ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත් වන අවස්ථාවේදීය. විභාග ගාස්තු ගෙවිය යුතු අයදුම්කරුවන්, විභාග ගාස්තුව වශයෙන් ගෙවිය යුතු මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ අදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුවන් නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදුනොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. මෙම විභාග ගාස්තු මොනම හේතුවක් නිසා හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයට මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

08. **භාෂා මාධ්‍යය :** මෙම විභාග සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු ඉදිරිපත් වන විෂයයන් සියල්ලම සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් නිසාවත් විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. **ප්‍රවේශ පත්‍ර :** විභාගය ආරම්භ කිරීමට දින දාහතරකට පමණ පෙර, නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා රට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්පත්‍රවල දක්වා ඇති රාජකාරි ලිපිනයන්ට ප්‍රවේශ පත්‍ර තැපැල් කර එවනු ලැබේ. ප්‍රවේශ පත්‍ර තැපැල් කළ බවට දැනුම් දීමක්, පුවත්පත් නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. පුවත්පත් නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඔහු විසින් හෝ ආයතන ප්‍රධානියා විසින් ඒ බව නොපමාව පහත දැක්වෙන තොරතුරු සපයමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත වාර්තා කළ යුතුය. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

1. විභාගයේ නම
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම
3. ලිපිනය
4. ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබාගතහැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය
5. ආයතන ප්‍රධානියා අයදුම්පත්‍ර තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කාර්යාලය යනාදිය සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකයට යොමුකළ යුතුය.

10. **අනන්‍යතා පත්‍ර :** මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක් ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක්
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

11. **අත්සන සහතික කිරීම :** අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගතයුතුය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

12. **ප්‍රතිඵල :** ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂය සඳහා ලකුණු 40% හෝ රට වැඩියෙන් ලබාගන්නා හා තමා පෙනී සිටි සියලුම විෂයන්ගෙන් ලද ලකුණුවල එකතුවේ සාමාන්‍ය 45% ක් හෝ රට වැඩිවූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙලට සකසන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්පත්‍ර හා ඇතුළත් වීමේ ලැයිස්තු ඉදිරිපත් කරන ලද ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

13. **විෂයය නිර්දේශය :** 1979 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කර ඇති සංශෝධිත විෂය නිර්දේශ පත්‍රිකාව සහ ව්‍යවස්ථා පිටපත් අදාළ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතන ප්‍රධානීන් අතර බෙදා හැර ඇත. මෙම විෂය නිර්දේශ හෝ ව්‍යවස්ථා පිටපත් නැවත නිකුත් කිරීමක් සිදු කළ නොහැකි බව සියලුම විභාග අපේක්ෂකයන් සහ ආයතන ප්‍රධානීන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

උක්ත විභාගය සම්බන්ධයෙන් මෙම විභාග නිවේදනයෙහි සඳහන් නොවූ කිසියම් කරුණක් වේනොත් එය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. එසේම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

කරුණාකර මෙම විභාග නිවේදනයෙහි අඩංගු කරුණු ඔබ ආයතනයට අයත් අදාළ ක්ෂේත්‍රයෙහි සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරවන්න.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

# උප ලේඛනය

## රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් (සිවිල් / යාන්ත්‍රික) සඳහා පවත්වනු ලබන ලිඛිත විභාග

### 1 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික)

| | විෂයය | විෂය අංක |
|---|---|---|
| 01. | ගණිතය(පහළ පත්‍රය) | 01 |
| 02. | ප්‍රමාණ ගැනීම(පහළ පත්‍රය) | 02 |
| 03. | මැනීම හා මට්ටම් ගැනීම (පහළ) | 03 |
| 04. | සැලසුම් ඇඳීම සහ පිටපත් කිරීම | 04 |
| 05. | මූලික ගොඩනැගිලි ඉදි කිරීම හා නඩත්තුව | 05 |
| 06. | ජල සම්පාදනය හා ජලාපවහනය | 06 |
| 07. | වැඩ බිම පාලනය | 07 |
| 08. | පාරවල් තැනීම හා නඩත්තුව (පහළ) | 08 |
| 09. | යාන්ත්‍රික ප්‍රමාණය | 09 |
| 10. | යාන්ත්‍රික ඇඳීම සහ පිටපත් කිරීම (පහළ පත්‍රය) | 10 |
| 11. | වැඩපල පුහුණුව | 11 |
| 12. | ප්‍රායෝගික වැඩ(වැද්දුම්, වඩු කම්හල් ආදිය) | 12 |
| 13. | මැනීම හා මට්ටම් ගැනීම(පහළ ප්‍රායෝගික) | 13 |

### 2 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික)

| | | | |
|---|---|---|---|
| 01. | ගණිතය (ඉහළ පත්‍රය) | | 21 |
| | ගොඩනැගිලි | ප්‍රමාණ ගැනීම ඉහළ පත්‍රය | 22A |
| | මූලික ජල සම්පාදනය හා ජලාපවහනය | | 22B |
| 02. | පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | | 22C |
| 03. | මැනීම හා මට්ටම් ගැනීම (ඉහළ) | | 23 |
| 04. | ගොඩනැගිලි | ඇඳීම | 24A |
| | මූලික ජලසම්පාදනය හා ජලාපවහනය | | 24B |
| | පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | | 24C |
| 05. | ගොඩනැගිලි ඉදිකිරීම (ඉහළ පත්‍රය) | | 25 |
| 06. | ජල සම්පාදනය හා ජලාපවහනය | | 26 |
| 07. | මාර්ග තැනීම හා නඩත්තුව (ඉහළ) | | 27 |
| 08. | පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | | 28 |
| 09. | වැඩ සංවිධානය | | 29 |
| 10. | යාන්ත්‍රික ප්‍රමාණ ගැනීම (ඉහළ) | | 30 |
| 11. | යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම(ඉහළ පත්‍රය) | | 31 |
| 12. | කර්මාන්තශාලා පුහුණුව | | 32 |
| 13. | මැනීම හා මට්ටම් ගැනීම (ඉහළ) ප්‍රායෝගික | | 33 |
| 14. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | | 34 |
| 15. | මුදල් රෙගුලාසි | | 35 |

## 3 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික)


| | | |
|---|---|---|
| 01. | සිවිල් ඉංජිනේරු විද්‍යාව I | 41 |
| 02. | සිවිල් ඉංජිනේරු විද්‍යාව II | 42 |
| 03. | පාරවල් තැනීම නඩත්තුව (සිවිල් ඉංජිනේරු වැඩ II C ) | 43 |
| 04. | සිවිල් ඉංජිනේරු විද්‍යාව III | 44 |
| 05. | සිවිල් ඉංජිනේරු විද්‍යාව IV | 45 |
| 06. | ගොඩනැගිලි ප්‍රමාණ ගැනීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම | 46 |
| 07. | වාස්තු විද්‍යාත්මක ඇඳීම | 47 |
| 08. | මැනීම හා මට්ටම් ගැනීම | 48 |
| 09. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව I | 49 |
| 10. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව II | 50 |
| 11. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව III | 51 |
| 12. | ඉංජිනේරු ආර්ථික විද්‍යාව | 52 |
| 13. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව - ඇඳීම | 53 |
| 14. | මැනීම හා මට්ටම් ගැනීම II (ප්‍රායෝගික) | 54 |

## APPENDIX

## WRITTEN EXAMINATIONS FOR TECHNICAL OFFICERS (CIVIL/MECHANICAL) IN PUBLIC SERVICE AND PROVINCIAL PUBLIC SERVICE

### 1st Examination: (Civil/ Mechanical)

| Subjects | | Subject Numbers |
|---|---|---|
| 1. | Mathematics (Lower Paper) | 01 |
| 2. | Taking out Quantities (Lower Paper) | 02 |
| 3. | Surveying & Leveling (Lower Paper) | 03 |
| 4. | Plan Drawing & Tracing | 04 |
| 5. | Elementary Building Construction & Maintenance | 05 |
| 6. | Water Supply and Drainage | 06 |
| 7. | Site Management | 07 |
| 8. | Road Construction and Maintenance (Lower Paper) | 08 |
| 9. | Mechanical Quantities | 09 |
| 10. | Machine Drawing and Tracing (Lower) | 10 |
| 11. | Workshop Practice | 11 |
| 12. | Practical Work (Fittings, Carpenter's shop etc.) | 12 |
| 13. | Surveying & Leveling (Lower) Practical | 13 |

### 2nd Examination (Civil/ Mechanical)

| | | | |
|---|---|---|---|
| 1. | Mathematics (Higher Paper) | | 21 |
| | Buildings | Taking out quantities (Higher Paper) | 22 A |
| | Elementary Water Supply & Drainage | Taking out quantities (Higher Paper) | 22 B |
| 2. | Bridge & Heave Structure Construction & Maintenance | | 22 C |
| 3. | Surveying & Leveling (Higher Paper) | | 23 |
| 4. | Buildings | Drawing | 24 A |
| | Elementary Water Supply & Drainage | Drawing | 24 B |
| | Bridge & Heavy Structure Construction & Maintenance | Drawing | 24 C |
| 5. | Building Construction (Higher Paper) | | 25 |
| 6. | Water Supply & Drainage | | 26 |
| 7. | Road Construction & Maintenance (Higher Paper) | | 27 |
| 8. | Bridge & Heavy Structure Construction & Maintenance | | 28 |

| | | |
|---|---|---|
| 9. | Work Organization | 29 |
| 10. | Mechanical Quantities (Higher Paper) | 30 |
| 11. | Machine Drawing & Tracing (Higher) | 31 |
| 12. | Factory Practice | 32 |
| 13. | Surveying & Leveling (Higher) Practical | 33 |
| 14. | Office Administration & Establishment Code | 34 |
| 15. | Financial Regulations | 35 |


**3rd Examination (Civil/Mechanical)**


| | | |
|---|---|---|
| 1. | Civil Engineering | 41 |
| 2. | Civil Engineering | 42 |
| 3. | Road Construction & Maintenance (Civil Engineering Works II C) | 43 |
| 4. | Civil Engineering III | 44 |
| 5. | Civil Engineering V | 45 |
| 6. | Building Quantity Surveying & Estimating of Building | 46 |
| 7. | Architectural Drawing | 47 |
| 8. | Surveying & Leveling | 48 |
| 9. | Mechanical Engineering | 49 |
| 10. | Mechanical Engineering II | 50 |
| 11. | Mechanical Engineering III | 51 |
| 12. | Economics of Engineering | 52 |
| 13. | Mechanical Engineering - Drawing | 53 |
| 14. | Surveying & Leveling II - Practice | 54 |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන්(සිවිල්/යාන්ත්‍රික) සඳහා පැවැත්වෙන ලිඛිත විභාගය - 2010/2016**

# Written Examinations for Technical Officers (Civil/Mechanical) in the Public & Provincial Public Service – 2010/2016

---

ඉදිරිපත් විමට අපේක්ෂිත විභාගය

1 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික) - 1
2 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික) - 2
3 වන විභාගය (සිවිල්/යාන්ත්‍රික) - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ-

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්):----------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

(උදා ඃ- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්):------------------------------------------------------------------------------------------

(උදා ඃ- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :-----------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්) ---------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්) --------------------------------------

----------------------------------------------------------------------------------------------------

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.3 දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ඔබ මේ විභාගයේදී පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් (විෂයයන් හා ඒවායේ අංක පහත දැක්විය යුතුය) ඃ-

| **විෂයය** | **විෂයය අංකය** |
|---|---|
| 1. ………………………………………………………………… | ……………. |
| 2. ………………………………………………………………… | ……………. |
| 3. ………………………………………………………………… | ……………. |
| 4. ………………………………………………………………… | ……………. |
| 5. ………………………………………………………………… | ……………. |
| 6. ………………………………………………………………… | …………….. |
| 7. ………………………………………………………………… | …………….. |
| 8. ………………………………………………………………… | …………….. |

05. අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය : ……………………………………………

(I) කාර්යාලීය ලිපිනය ඃ- ………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

06. සේවා විස්තර ඃ-

(I) දැනට දරණ තනතුර : ……………………………………………
(II) ශ්‍රේණිය/පන්තිය : ……………………………………………
(III) මුල්පත්වීම් ලිපියේ අංකය හා දිනය : ……………………………………………
(IV) මෙම විභාගයෙන් ඔබ සමත් වුවහොත් අපේක්ෂා කෙරෙන ඊළඟ උසස්වීමේ ශ්‍රේණිය/පන්තිය ඃ-
………………………………………………………………………………

07. (I) ඔබ පෙනී සිටීමට අපේක්ෂිත විභාගය අයත් ශ්‍රේණිය/පන්තිය ඃ-: ……………………………
(II) එම ශ්‍රේණිය/පන්තිය, සිවිල්/යාන්ත්‍රික අංශ දෙකෙන් කවරකට අයත් වේද ඃ- : …………………

08. ඔබ මීට පෙර වතාවක මෙම විභාගයට පෙනී සිටියේ නම්, විභාගය, වර්ෂය, මාසය, විභාග අංකය හා ඔබ එහිදී සාමාර්ථය ලැබූ විෂයයන් මෙහි දක්වන්න.
………………………………………………………………………………..
………………………………………………………………………………..

09. ඔබ අංක 06 යටතේ දක්වා ඇති විෂයයන් සඳහා ප්‍රථම වතාවට පෙනී සිටින්නෙක්ද?
………………………………………………………………………………..

10. විභාග ගාස්තු :

(I) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :……………………………..
(II) ගෙවූ මුදල :……………………
(III) ගෙවූ දිනය :…………………… (IV) ලදුපත් අංකය :……………………..

ලදුපත එහි එක් දාරයක් මගින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

11. (I) මෙම අයදුම්පතේ මවිසින් දක්වන ලද සියළුම විස්තර මාගේ දැනුමේ පමණින් සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි.
(II) විභාගයට අදාළ විභාග ගාස්තුව වශයෙන් රු…………. ක් ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කර සිටිමි.
(III) මා මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබුවකු නොවන බව විභාගයට පෙර හෝ ඉන් පසුව හෝ අනාවරණය වුවහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඇති අයිතිය හා බලය අවිවාදයෙන් පිළිගනිමි.
(IV) තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය ඃ- ………………………….. ……………………………
අයදුම්කරුගේ අත්සන

---

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම් සඳහන් නිලධාරියා විසින් මෙම අයදුම්පතෙහි අංක 04,05 සහ 06 යන ඡේදවලදී දක්වා ඇති විස්තර සත්‍ය බවත්, මෙම විභාගයට අදාළ කොන්දේසි හා ව්‍යවස්ථා යටතේ මෙම විභාගයට පෙනී සිටීමට ඔහු සුදුසුකම් ලබා ඇති බවත් මෙවර අයදුම්කොට ඇත්තේ මෙහි 05 ඡේදයෙහි දක්වා ඇති ශ්‍රේණියට/පන්තියට අයත් විභාගය සඳහා පමණක් බවත්, විභාගයට අදාළ විභාග ගාස්තුව ගෙවා එම ගදුපත අලවා ඇති බවත් සහතික කරමි.

……………………………………………..
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

ආයතනය ඃ- ………………………………………………………………..
(අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/සංස්ථාව/මණ්ඩලය/පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අනෙකුත් ආයතන

දිනය ඃ- ……………………..
(අනවශ්‍ය වචන කපා හරින්න)